# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019
### 2023 අගෝස්තු / සැප්තැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### පුස්තකාල හා විඥාපන විද්‍යාව (නව/පැරණි නිර්දේශය)

### ග්‍රන්ථ විඥාපන පාලනය, සූචිකරණය න්‍යාය හා පරිචය - LISC – E 2015

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පහත දී ඇති උපදෙස් අනුව සුදුස සූචි පත්‍රිකා සකසන්න.
    - i. ග්‍රන්ථ නාම පිටු අංක 01 සඳහා ප්‍රධාන සංලේඛය පමණක් සකසන්න. (ලකුණු 08)
    - ii. ග්‍රන්ථ නාම පිටු අංක 02 සඳහා ප්‍රධාන සහ අතිරේක සංලේඛ සකසන්න. (ලකුණු 12)

02. ග්‍රන්ථ විඥාපන පාලනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර ග්‍රන්ථ විඥාපන සේවා මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 20)

03. ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ සුවිශේෂතා උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 20)

04. 
    - i. විෂය සූචිකරණය යනු කුමක්ද? (ලකුණු 08)
    - ii. විෂය සූචිකරණය සඳහා යොදාගත හැකි විවිධ මෙවලම් (tools) මොනවාදැයි ඒවායේ ලක්ෂණ නිදසුන් ලෙස ගෙන විස්තර කරන්න. (ලකුණු 12)

05. 
    - i. සූචියේ විවිධ බාහිර ස්වරූප කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 08)
    - ii. සූචියේ විවිධ බාහිර ස්වරූප අතර මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (OPAC) වර්තමාන පාඨක අවශ්‍යතා සැපිරීමට හැමතින්ම සුදුසු සූචි ස්වරූපයක් ලෙස හඳුන්වන්නේ කුමන හේතු නිසාදැයි මාර්ගගත සූචියේ ලක්ෂණ හා ගුණාංග සැලකිල්ලට ගෙන විස්තර කරන්න. (ලකුණු 12)

06. 
    - i. අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ විස්තරයේ (ISBD) අඩංගු සංරචක නම් කරන්න. (ලකුණු 05)
    - ii. එකී සංරචක අතරින් ඔබ අභිමත සංරචක හතරක් (04) පිළිබඳ සුදුසු නිදසුන් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15)

07. පහත දක්වා ඇති මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    - i. ඒකීය ග්‍රන්ථ නාම
    - ii. ආයතන කර්තෘ
    - iii. ප්‍රධාන සංලේඛය
    - iv. මිශ්‍ර කර්තෘ
    - v. අන්තර් නිර්දේශ

**********************************